**වැඩබලන ප්‍රධාන නියෝජ්‍ය සහකාර රාජ්‍ය ලේකම්**
**තෝමස් ජේ වයිඩා ගේ**
**ආරම්භක ප්‍රකාශය**
**පාර්ත්ෆයින්ඩර් කණ්ඩායම් සාකච්ඡාව**
**කොළඹ, ශ්‍රී ලංකාව**
**පෙබරවාරි 14, 2019**

ස්තුතියි. මෙහි පැමිණීමට ලැබීම ඉතා සතුටට කරුණක් වන අතර ප්‍රසිද්ධ බුද්ධිමතුන් දෙදෙනෙක් සමඟ මේ මේසයේ එකට සිටීමට ලැබීම සැබවින්ම මහත් ගෞරවයකි. මගේ රටේ තානාපති ලෙස සේවය කිරීම ඇතුළු ඉතා විශිෂ්ට හා ගෞරවනීය සේවයක් ඉටු කර ඇති තානාපතිවරයෙක් හා ඔබේ නාවික හමුදාවේ හිටපු ප්‍රධානියා වන අද්මිරාල්වරයෙක් අතර සිටීමට ලැබීම මගේ සතුටට හේතු වේ. මට ආරාධනය කිරීම ගැනත්, ඉන්දු-පැසිෆික් කලාපය පිළිබඳ එක්සත් ජනපද ප්‍රතිපත්ති සම්බන්ධයෙන් ඔබ දක්වන උනන්දුව ගැනත් මම ස්තුතිවන්ත වෙමි.

සඳහන් කර ඇති පරිදි, මම මෙම කලාපයට බලපාන අන්තර්ජාතික හා ආර්ථික කටයුතු සඳහා වගකිය යුතු, රාජ්‍ය දෙපාර්තමේන්තුවේ වැඩ බලන ප්‍රධාන නියෝජ්‍ය සහකාර ලේකම්වරයා වෙමි. වඩාත් තීරණාත්මක ලෙස මෙයට ඉන්දු-පැසිෆික් කලාපය සඳහා වූ එක්සත් ජනපදයේ දැක්ම ක්‍රියාත්මක කිරීම ද ඇතුළත් වන අතර, මා අද ඒ පිළිබඳ ව කථා කරන්නේ විශේෂයෙන්ම මෙම කලාපය තුළ ශ්‍රී ලංකාවේ වැදගත් භූමිකාව කෙරෙහි අවධානය යොමු කරමින් ය.

ඉන්දු-පැසිෆික් කලාපය තුළ පිහිටා ඇති ශ්‍රී ලංකාවට, කලාපයේ අනාගතය නිර්මාණය කිරීමේ අවස්ථාව ලැබී තිබේ. කලාපය තුළ සියලු ජාතීන් දියුණු වීමට නම්, එම අනාගතය, රීති මත පදනම් වූ පටිපාටියකින්, සංවර්ධන ආධාර හා යටිතල ව්‍යාපෘති පිළිබඳ පාරදෘශ්‍ය ප්‍රමිති හා මූලික නිදහස සහ මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම ආදිය මත පදනම් විය යුතුය.

2017 දී ආසියා-පැසිෆික් ආර්ථික කොමිසමේ (APEC) දී නිදහස් හා විවෘත ඉන්දු-පැසිෆික් කලාපයක් පිළිබඳ ව ජනාධිපති ට්‍රම්ප් සිය දැක්ම සැකවින් ඉදිරිපත් කළේ ය. ඔහු ඉන්දු-පැසිෆික් ප්‍රදේශය විස්තර කලේ "විවිධ සංස්කෘතීන් හා වෙනස් සිහින ඇති ස්වෛරී හා ස්වාධීන රාජ්‍ය සියල්ලට ම එක් ව සමෘද්ධිමත් විය හැකි හා නිදහස් ව හා සාමකාමී ව දියුණු විය හැකි කලාපයක්" ලෙසයි. මෙම දර්ශනය අඛණ්ඩව අපගේ වැඩ කටයුතුවලට රාමුවක් සපයන අතර ශ්‍රී ලංකාව වැනි සමාන අදහස් ඇති හවුල්කරුවන්ගේ ඉලක්ක වලට ඌනපූරණයක් සපයයි.

අපගේ මෙම ප්‍රවේශය යටතේ, ආරවුල් සාමකාමී ලෙස විසඳා ගැනීම, නිදහස් නාවික ගමන්, විවෘත හා විනිවිද පෙනෙන ආයෝජන පරිසරයක්, ප්‍රබල හා වගකියන පාලන ආයතන වැනි මූලධර්මවලට ගරු කරන ඉන්දු පැසිෆික් කලාපයක රීති පදනම් ක්‍රියා පිළිවෙළක් ආරක්ෂා කිරීමට හා වැඩි දියුණු කිරීමට ශ්‍රී ලංකාව වැනි ප්‍රධාන හවුල්කරුවන් සමග අපි කටයුතු කරමු. පසුගිය දශක ගණනාවක් පුරා මෙහි හා කලාපයේ හා වෙනත් ප්‍රදේශවල මෙතරම් වර්ධනයක් සහ සමෘද්ධියක් උදා කළ තත්වයන් නිර්මාණය කළේ මෙම මූලධර්මයි. අපේ අදහස වන්නේ කලාපයේ අනාගතය සම්බන්ධයෙන් ද ඒවා තීරණාත්මක වන බවයි.

මෙය අනන්‍ය උපාය මාර්ගයක් නොවන බවත් ශ්‍රී ලංකාව වැනි අපේ හවුල්කරුවන් සඳහා විකල්ප දෙකක් අතරින් එකක් පමණක් යෝජනා කිරීමක් නොවන බවත් අවධාරණය කිරීමට කැමැත්තෙමි. ශ්‍රී ලංකාව ස්වෛරී ජාතියක් වන අතර එහි මෙන් ම අනිකුත් ජාතීන්ගේ ස්වෛරීභාවයට අපි දක්වන ගරුත්වය ඉන්දු-පැසිෆික් කලාපයේ අපේ කටයුතුවලට මග පෙන්වයි. එක්සත් ජනපදය මෙන් ම, කලාපය පුරා හා සැබැවින් ම ලෝකය පුරා සියලු රටවල් සමග අන්‍යෝන්‍ය වශයෙන් ඵලදායී හවුල්කාරිත්වයක් ගොඩනැඟීම සහ පවත්වා ගෙන යාම අපි ශ්‍රී ලංකාවෙන් අපේක්ෂා කරමු. කෙසේ වෙතත්, එවැනි සබඳතා දිගු කාලීන වශයෙන්, සම්බන්ධ වන සියලුම පාර්ශ්වයන්ට සැබවින්ම ප්‍රයෝජනවත් විය යුතු මෙන් ම පාරදෘශ්‍ය විය යුතුය. නිරුවත් වාණිජ ආත්මාර්ථය හා සැඟවුණු න්‍යාය පත්‍ර මත පදනම් වූ අනාගතය උකස් කරන ගනුදෙනු, කලාපයේ දීර්ඝ කාලීන ස්ථාවර බව හා ජීව ගුණය දුර්වල කරයි.

අපේ ද්වි-පාර්ශවික සබඳතා හා අපේ ඉන්දු-පැසිෆික් රාමුව යන දෙක ම යටතේ අපගේ ඉලක්කය වන්නේ එක්සත් ජනපදය සමඟ සහයෝගීතාවයෙන් සවිබල ගැන්වෙන ශ්‍රී ලංකාවකි. ඒ මගින් ඇති වන පුළුල් වර්ධනයෙන් සියලු දෙනාට ම සමාන අවස්ථා හා ප්‍රතිලාභ අත් කර දෙනු ඇත.

විශේෂයෙන් ම සංවර්ධනය හා යටිතල පහසුකම් සම්බන්ධයෙන් අප ශ්‍රී ලංකාවට පිරිනමන්නේ සැබෑ සහ විනිවිද පෙනෙන සහයෝගීතාවකි. එක්සත් ජනපදය ශ්‍රී ලංකාවට ලබා දෙන්නේ ආර්ථික වශයෙන් අර්ථවත් මෙන් ම පුද්ගලික ප්‍රාග්ධනය ආකර්ෂණය කර ගත හැකි හා තිරසාර නොවන ණයවීම් වළක්වා ගත හැකි ව්‍යාපෘති වේ.

කලාපයේ තීරණාත්මක හවුල්කරුවකු ලෙස අප ශ්‍රී ලංකාව සැලකීම පුදුමයට කරුණක් නොවිය යුතුය. එක්සත් ජනපදය යනු ශ්‍රී ලංකාවේ විශාලතම අපනයන වෙළඳපොළ වන බැවින්, ඒ තුළින් මෙහි කෘෂිකර්මාන්ත අංශයේ, නිෂ්පාදන සහ සේවා අංශයේ දස දහස් ගණනක ගේ රැකියා සඳහා අනුග්‍රහය ලබා දෙයි. මීට අමතරව, එක්සත් ජනපද සමාගම් විසින් ඉහළ ගුණාත්මක බවකින් යුත් රැකියා සිය ගණනක් ශ්‍රී ලංකාවේ උත්පාදනය කිරීම සඳහා ඩොලර් මිලියන 300 කට වැඩි ආයෝජනයක් කර තිබේ.

එක්සත් ජනපද සමාගම් ව්‍යාපෘති සඳහා ලංසු තබා ඒවා ලබා ගත් විට හෝ බියගම නවීනතම කොකා කෝලා කම්හල වැනි නව කර්මාන්තශාලාවක් සඳහා ආයෝජනය කරන විට, ඒ සඳහා හොඳ ම තාක්ෂණය, නිපුණතා සහ දැනුම ගෙන එන අතර ඒවා ශ්‍රී ලාංකික හවුල්කරුවන් සමඟ බෙදා හදා ගනී. තොරතුරු තාක්ෂණය හා ප්‍රවාහනය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව කේන්ද්‍රස්ථානයක් බවට පත් වන විට, එක්සත් ජනපද ආයෝජන සහ වෙළඳාම් සඳහා ඇති විභවය තව තවත් වැඩි වනු ඇත.

අපට අවශ්‍ය වන්නේ යහපාලනය, වගකිවයුතු හා පරිපූර්ණ ආර්ථික ප්‍රතිපත්ති හා භාවිතයන්, වග වීම සහ ඉතා වැදගත් වන නීතියේ ආධිපත්‍යය ආදිය තුළින් ශක්තිමත් වන හා වර්ධනය වන ආර්ථිකයක් නිර්මාණය කිරීමේ හැකියාව ප්‍රයෝජනයට ගන්නා ශ්‍රී ලංකාවක් දැකීමටයි.

තිරසාර හා පරිපූර්ණ ආර්ථික වර්ධනයක් තහවුරු කිරීම සඳහා ශ්‍රී ලංකාව සමඟ එක්ව කටයුතු කිරීමට එක්සත් ජනපදයේ සිටින අප සූදානම් බව ප්‍රකාශ කරමි. මෙයින් විශාල කොටසක් වන්නේ ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීම හා ශ්‍රී ලංකාව තුළ සිටින දීප්තිමත් ම තරුණයන්ට සංකල්පවල සිට යථාර්ථය දක්වා ඔවුන්ගේ අදහස් දියුණු කර ගැනීමට ඉඩ ප්‍රස්ථා සැලසීමයි. අන්තර් ජාතික සංවර්ධනය සඳහාවූ එක්සත් ජනපද ආයතනයේ යූලීඩ් (USAID's YouLead) වැඩසටහන මගින් ශ්‍රී ලංකාවේ තරුණ ව්‍යවසායකයන් දිරි ගැන්වීමට අවශ්‍ය නව මෙවලම්, වෘත්තීය හා තාක්ෂණික අධ්‍යාපනඥයින්ට ලබා දෙමින් ශ්‍රී ලංකාවේ ව්‍යවසායකත්ව විෂය මාලාවන් හී විප්ලවීය වෙනසක් ඇති කර තිබේ.

පසුගිය වසරේ දී එක්සත් ජනපද තානාපති කාර්යාලය මාතර දිස්ත්‍රික් වාණිජ හා කර්මාන්ත මණ්ඩලය සමග සම්බන්ධ වී ඇමරිකන් නවෝත්පාදන මධ්‍යස්ථානයක් දියත් කළ අතර ඒ තුළින් තරුණ තරුණියන්ට රැකියා හා නායකත්ව කුසලතා ලබා දෙමින්, තාක්ෂණික හා ඉන්ජිනේරු වැඩසටහන් මගින් දකුණු පළාතේ නිර්මාණශීලීත්වය, නවෝත්පාදනය හා ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීමට කටයුතු කරයි. මෙම වැඩසටහන් ප්‍රතිඵල පාදක කර ගෙන සකස් කර ඇති අතර පසුගිය කාලය පුරාම ඒවා ඵලදායී බව ඔප්පු වී තිබේ.

2011 දී අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද ආයතනය (USAID) විසින් ශ්‍රී ලංකාවේ කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායක ක්ෂේත්‍රයේ කාන්තාවන් බල ගැන්වීම සහ ග්‍රාමීය ආර්ථිකය නඟා සිටුවීම ඉලක්ක කරගත් බිස් + (BIZ+) යනුවෙන් හැඳින්වෙන ආයෝජන ප්‍රදාන වැඩසටහනක් මගින් ශ්‍රී ලංකාවට ආධාර ලබා දුන්නේය. මෙම වැඩසටහන මේ වන විට අවුරුදු අටක් තිස්සේ ක්‍රියාත්මක වී ඇති අතර මේ කාලය තුළ එක්සත් ජනපද රජයේ ආධාර මගින් සෘජු රැකියා 7,500 කට අධික සංඛ්‍යාවක් සහ වක්‍ර රැකියා 5,200 කට වැඩි ප්‍රමාණයක් බිහි කිරීම සඳහා පෞද්ගලික අංශයේ ආයෝජන දිරි ගන්වා තිබේ. මේවා එක් වරකට සීමා වූ ආයෝජන නොවේ. මේවා පරම්පරා ගණනාවකට ප්‍රතිලාභ අත් කර දෙන බැඳුණු පොරොන්දු වේ.

අනාගතය දෙස බලන අතරම අප වර්තමානයට ද අවධානය යොමු කරමු. ඉන්දු පැසිෆික් ක්‍රමෝපායේ වැදගත් ප්‍රමුඛතාවක් වන්නේ නව්‍යකරණය සහ සමෘද්ධිය ප්‍රවර්ධනය කිරීමේ ශක්තිමත් වාර්තාවක් ඇති එක්සත් ජනපද සමාගම් හරහා පුද්ගලික අංශය නායකත්වය දෙන ආර්ථික වර්ධනය වේගවත් කිරීමයි. 2017 දී ඉන්දු-පැසිෆික් කලාපය සමඟ එක්සත් ජනපදයේ ද්වි-මාර්ග වෙළඳාම ඩොලර් ට්‍රිලියන 1.8 පමණ වූ අතර කලාපයේ එක්සත් ජනපදය විසින් සිදු කළ සෘජු විදේශ ආයෝජනයේ වටිනාකම ඩොලර් ට්‍රිලියන 1 ක් පමණ වේ. පසුගිය දශකය තුළ එය දෙගුණයකටත් වඩා වැඩි වී ඇති අතර එය කලාපීය විදේශීය ආයෝජනයේ විශාලතම ප්‍රභවය බවට පත් වී ඇත..

මෙම පොරොන්දුව මත තවදුරටත් ආයෝජන වැඩි කිරීමට බලශක්ති, ඩිජිටල් ආර්ථිකය හා යටිතල පහසුකම් ක්ෂේත්‍රය තුළ පෞද්ගලික අංශය සමග අපේ හවුල්කාරිත්වය පුළුල් කිරීම සඳහා නව ව්‍යාපෘති ආරම්භ කර ඇති අතර, මෙම ප්‍රධාන අංශ සම්බන්ධයෙන් තාක්ෂණික සහාය, ශක්‍යතා අධ්‍යයන සහ නියාමන ප්‍රතිසංස්කරණ ආදිය සඳහා අමතර අරමුදල් ලබා දෙනු ඇත.

අපගේ සංවර්ධන මූල්‍ය හැකියාවන් නවීකරණය කිරීමේ වැඩපිළිවෙළක් ද අපි ක්‍රියාත්මක කරමු. පසුගිය ඔක්තෝබරයේ අත්සන් කරන ලද බිල්ඩ් පනත (Build Act) මගින් නව එක්සත් ජනපද ජාත්‍යන්තර සංවර්ධන මූල්‍ය සංස්ථාව (IDFC) පිහිටුවන ලදී. එහි ණය සීමාව ඩොලර් බිලියන 60 වන අතර එය වර්තමාන සීමාව මෙන් දෙගුණයකටත් වඩා වැඩි වීමකි. මෙයට අමතරව කලාපයේ පෞද්ගලික අංශයේ ආයෝජන දිරිගැන්වීම සඳහා අතිරේක ඩොලර් බිලියන 30ක් ලබා දෙනු ඇත. නව ආයෝජනවලට සහාය වීම සඳහා එක්සත් ජනපද ජාත්‍යන්තර සංවර්ධන මූල්‍ය සංස්ථාව (IDFC) විසින් නව ආයෝජකයන්ට ණය, ණය සහතික සහ අවදානම් රක්ෂණය ආදිය ලබා දෙනු ඇත. හවුල්කාර මූල්‍ය ආයතන සමග සහයෝගයෙන් කටයුතු කිරීම පහසු කිරීම සඳහා කොටස් ආයෝජන හා ශක්‍යතා අධ්‍යයන හෝ විභව ආයෝජන සඳහා අරමුදල් සපයනු ඇත.

මීට අමතරව, ප්‍රවාහන හා ඉඩම් ක්ෂේත්‍රවල ආර්ථික වර්ධනය සඳහා ඇති බාධක ඉවත් කිරීම ඉලක්ක කර ගත්, ශ්‍රී ලංකාව සමග ඇති මිලේනියම් චැලෙන්ජ් කෝපරේෂන් (MCC) ගිවිසුම සම්බන්ධයෙන් එක්සත් ජනපදය සැලකිය යුතු ප්‍රගතියක් ලබා තිබේ. එය ක්‍රියාත්මක වන විට ශ්‍රී ලංකාව වැඩි ආර්ථික සමෘද්ධියක් කරා ගෙන යා හැකි කාර්යක්ෂමතාවක් බිහි කිරීමට තුඩු දෙන අනාගත ආයෝජන කෙරෙනු ඇත. ආයෝජකයින් මෙහි ගෙන ඒම සඳහා අපේ කාර්යභාරය අප ඉටු කරමින් සිටින අතර මෙම වෙළඳපොළට ඇතුළු වීමට අපේක්ෂා කරන ආයෝජකයන්ට වඩාත් ආකර්ෂණීය පරිසරයක් නිර්මාණය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය සමග කටයුතු කරමින් සිටිමු.

මේ සියල්ලෙන්ම කියවෙන්නේ, විශේෂයෙන්ම එක්සත් ජනපදය හා ශ්‍රී ලංකාව අතර මෙන්ම පොදුවේ ඉන්දු පැසිෆික් කලාපයේ ආර්ථික සහයෝගිතාව හා ආයෝජන මෙන් ම දෙ-මං වෙළඳාම පුළුල් කිරීමට නව අවස්ථා උදා වනු ඇති බවයි.

කලාපය තුළ ඔබේ රටට විශාල බලපෑමේ කාර්ය භාරයක් ඉටු කිරීමට ඇති අතර මෙම අවස්ථාවන්ගෙන් සැලකිය ප්‍රයෝජනයක් ලබා ගත හැකි වේ. නිදසුනක් වශයෙන් එක් ණය දෙන්නෙකුට විශාල ණයගැති බවක් ඇතිවීම වළක්වමින් ශ්‍රී ලංකාව හා සමාන අදහස් ඇති අනිකුත් හවුල් කරුවන් සමග රටේ අවශ්‍යතාවට ගැළපෙන උසස් තත්ත්වයේ යටිතල පහසුකම් සපයන ආධාර ව්‍යාපෘති ගැන අපි උනන්දු වෙමු.

එක්සත් ජනපද සමාගම් දැනටමත් මෙහි විදුලි බල උත්පාදනය හා යටිතල පහසුකම් සපයන්නන් වන අතර, කොළඹ වරාය, නෞකාවන්ට මග පෙන්වීම සඳහා එක්සත් ජනපද තාක්ෂණයේ සහාය ලබා ගනී. ඇත්ත වශයෙන් ම වරාය, ශ්‍රී ලංකාවේ රජයට විශාලතම ආදායම් මාර්ගයක් වන අතර ආර්ථික වර්ධනයට විශාල විභව සම්පතකි. ඉන්දියානු සාගරයේ නාවික කේන්ද්‍රස්ථානයක් වීමේ ශ්‍රී ලංකාවේ ඉලක්කයට ළඟා වීම සඳහා මෙය තීරණාත්මක වේ.

මුළු ලෝකයට අවශ්‍ය වන සුරක්ෂිත ලෙස නැව් භාණ්ඩ ප්‍රවාහනය කිරීම සඳහා වරාය ආරක්ෂා සහිත ලෙස පවත්වා ගැනීමට එක්සත් ජනපද රජය විසින් ප්‍රධාන කාර්යභාරයක් ඉටු කර තිබේ . 2005 සිට එක්සත් ජනපද රේගු සහ දේශ සීමා ආරක්ෂක ඒජන්සිය එහි බහාලුම් ආරක්ෂක ව්‍යාපෘතිය තුළින්

එක්සත් ජනපදයට යන අධි අවදානම් නැව් භාණ්ඩ අනාවරණය කර ගැනීම සඳහා ශ්‍රී ලංකා රේගුවේ මධ්‍යම බුද්ධි අංශ සමඟ එක්ව කටයුතු කර තිබේ. විකිරණශීලී ද්‍රව්‍ය අනාවරණය කර ගැනීම හා විකිරණශීලී ද්‍රව්‍ය පැතිරීම වැළැක්වීම සඳහා කොළඹ වරාය, එක්සත් ජනපද බලශක්ති දෙපාර්තමේන්තුවේ 'මෙගාපෝට්' (Megaport) ව්‍යාපෘතිය සමග එක්ව කටයුතු කරයි.

ආරක්ෂාව පිළිබඳ ආධාර අතින් බලන විට අපේ බෙංගාල බොක්ක ව්‍යාපෘතියේ කොටසක් ලෙස නාවික ආරක්ෂාව, නිදහස් නාවික ගමනාගමනය සහ සමුද්‍රික වසම් දැනුවත් කිරීම සඳහා ශ්‍රී ලංකාවට ඩොලර් මිලියන 39 ක මුදලක් යොමු කිරීමට අපි බලාපොරොත්තු වෙමු. මේ මගින් දකුණු ආසියාවේ මානුෂීය ආධාර සහ ආපදා සහන පහසුකම් ශක්තිමත් කිරීමට ද හැකි වනු ඇත.

සමුද්‍රීය ප්‍රදේශ නීත්‍යානුකූල ආර්ථික කටයුතු සඳහා යොදා යොදා ගැනීමත්, මුහුදු කොල්ලකෑම්, නීති විරෝධී ලියාපදිංචි නො කළ ධීවර කටයුතු සහ නීති විරෝධී භාණ්ඩ ප්‍රවාහනය වැළැක්වීම සහතික කිරීමත් සඳහා ශ්‍රී ලංකාව සහ අනෙකුත් රටවලට සහාය වීමට අපට අවශ්‍ය බැවින් මෙම ව්‍යාපෘතියේ වැදගත් ආර්ථික අංශයක් ද ඇති බව මම මෙහි දී සඳහන් කළ යුතු වේ.

ආපදා ප්‍රතිචාර, මානුෂීය ආධාර සහ සමුද්‍රීය ආරක්ෂාව වැනි විවිධ කරුණු සම්බන්ධයෙන් අපේ හමුදාවන් එක්ව පුහුණු වේ. මෙම ඒකාබද්ධ පුහුණුවීම් සැලසුම් කර ඇත්තේ අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රයෝජනවත් වන ලෙසත්, ශ්‍රී ලංකා හමුදාව, සාම කාල හමුදාවක් බවට පරිවර්තනය කිරීමට සහාය වීමත් සඳහාය.

පසුගිය අගෝස්තු මාසයේ දී හොනොලුලුවල පැවති උත්සවයක දී අති නවීන එක්සත් ජනපද වෙරළ ආරක්ෂක නෞකාවක් ශ්‍රී ලංකා නාවික හමුදාවට බාර දෙන ලද අතර ශ්‍රී ලංකාව පළමු වරට. 2018 දී පැසිෆික් වළල්ලේ අභ්‍යාසවලට සහභාගි වූයේය.

ශ්‍රී ලංකාව සමඟ අපේ හවුල්කාරීත්වය සැබවින්ම සියලූ ම අංශ ආවරණය කරයි. මෙහි දී වඩාත් ම වැදගත් වන්නේ, එය අනාගත පරම්පරාවන්හි සියලු දෙනාටම වාසිදායක තිරසාර ප්‍රතිඵල ලබා ගත හැකි අන්‍යෝන්‍ය වශයෙන් ඵලදායී, පාරදෘශ්‍ය සබඳතාවක් වීමයි.

එක්සත් ජනපදය ඉන්දු පැසිෆික් කලාපයේ වඩා ශක්තිමත් සම්බන්ධතාවන් සඳහා වැඩි අවධානයක් යොමු කරන විට, ශ්‍රී ලංකාව දෙස බලන්නේ අගනා මිතුරෙක් ලෙස හා එම ක්‍රියාවලියේ නායකත්වය ගත හැකි හවුල්කරුවකු ලෙසයි.

එබැවින්, මෙම ප්‍රයත්නයන්හි දී කොළඹ ක්‍රියාශීලී ව්‍යාපාරික ප්‍රජාව ඇතුළු සියලුම මට්ටම්වලදී ශ්‍රී ලංකාවේ සහයෝගීතාව අප මහත් සේ අගයන බව ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරමි..

මම කථාව නතර කළත්, යමෙකුට ප්‍රශ්නයක් ඇත්නම් මම එයට පිළිතුරු දීමට සූදානම්.

###.